# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 10

සම්පත් ගනේපලආරච්චි

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් (Events After the Reporting Period)

මෙම ප්‍රමිතයට අනුව ''වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්'' පහත ලෙස නිර්නවනය කර තිබේ.

## 1. නිර්වචනය – Definition

''වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසාන දිනයත්, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පවරන දිනයත්, අතර සිදුවන වාසි සහගත හා අවාසිසහගත සිදුවීම් වේ.''

මෙම සිදුවීම් ප්‍රධාන වර්ග 2 ට බෙදිය හැක.

1. වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවති තත්ත්වයන්ට තවදුරටත් සාක්ෂි සපයන සිදුවීම්.
2. වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ තත්ත්වයන් නිරූපනය කරන සිදුවීම්.

මෙය පහත රූප සටහන තුළින් තවදුරටත් පැහැදිලි කළ හැක.

වාර්තාකරන කාලපරිච්ඡේදයේ ආරම්භක දිනය 2019.04.01

වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසාන දිනය 2020.03.31

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පවරන දිනය උදා: ලෙස 2020.07.01

වාර්තා කරන කාලපරිච්ඡේදය

වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇතිවන සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවති තත්ත්වයන්ට තවදුරටත් සාක්ෂි සපයන සිදුවීම්

මෙම සිදුවීම්වල බලපෑම ප්‍රමාණාත්මකවේ නම් වාර්තා කරන කාලච්ඡේදයට ගැලපිය යුතුය. එනම් 2019/2020 වර්ෂයකට ගැලපිය යුතුය. මේ නිසා මේවා ''ගලපන සිදුවීම්'' (Adjust Events) ලෙසද හඳුන්වයි.

උදා :

- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට සිටි ප්‍රධාන ණයගැතියෙකු බුන්වත් වී ඇති බව එදිනෙන් පසු තහවුරු කිරීම.
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවති තොග එදිනෙන් පසු දිනකදී යල් පැනීම.
- සංචිතවලට මාරු කිරීම්
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනෙන් පසු දිනක පෙර වර්ෂයක සිදුව ඇති වංචාවක් හෝ වරදක් හඳුනාගැනීම.
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනෙන් පසු දිනකදී ප්‍රසාද දීමනාවක් හෝ ලාභ බෙදාගැනීමක් සිදු කිරීමට තීරණයක් ගැනීම. (නෛතික හෝ සම්මුතික බැඳීමක් පවතීනම්)
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවති අසම්භාව්‍ය වගකීමක් එදිනෙන් පසු දිනක තහවුරු වීම.

වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ තත්ත්වයන් නිරූපනය කරන සිදුවීම්

මේවා වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසුව ඇති වූ තත්ත්වයන් නිරූපනය කරන නිසා වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට ගැලපීම් කරනු නොලබයි. එනම් 2019/2020 වර්ෂයට නොගැලපිය යුතුයි. මේ නිසා මේවා ''නොගලපන සිදුවීම්'' (Non adjust events) ලෙසද හඳුන්වයි.

උදා :

- ලාභාංශ ප්‍රකාශ කිරීම - සාමාන්‍ය කොටස් සඳහා
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසුව ගින්නෙන්, ගං වතුර වැනි විපත් තුළින් වත්කම්වලට සිදුවන හානි.
- ආයෝජනයන්හි වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසුව වෙළඳපොලේ ඇතිවන මිල පහළ යාම්.
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසුව ව්‍යාපාරයේ එක් අංශයක් වෙනත් පාර්ශවයක් පවරා ගැනීම.
- ප්‍රධාන ප්‍රතිව්‍යුහගතකරණයක් ප්‍රකාශයට පත් කිරීම හෝ ආරම්භ කිරීම.
- ප්‍රධාන සාමාන්‍ය කොටස් ගණුදෙනුවක්
- බදු අනුපාතයන්හි වෙනස්වීමක් හෝ බදු පනත්හි වෙනස්වීම්.
- වැදගත් ඇපවීමක් සම්බන්ධ එකඟතාවයන්ට පැමිණීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## 2. වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වු තත්ත්වයන් නිරූපනය කරන සිදුවීම් හෙළිදරව් කිරීම- - Disclosure

1. සිදුවීම් ස්වභාවය
2. අදාළ සිදුවීම තුළින් ඇතිවන බලපෑම පිළිබඳ ඇස්තමේන්තුවක් හෝ එලෙස ඇස්තමේන්තුවක් කළ නොහැකි නම් ඒ පිළිබඳ ප්‍රකාශනයක්

## 3. පොදුවේ කළයුතු හෙළිදරව් කිරීම -- Disclosure

1. මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා බලය පැවරූ දිනය හා බලය පැවරුවේ කවුරුන්ද යන වග
2. ආයතන හිමිකරුවන්ට හෝ වෙනත් පාර්ශ්වයකට මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු ඒවා වෙනස්කිරීමේ බලයක් පවතීනම්, ඒ බව.

### උදාහරණ : 04

සීමිත Y සමාගමේ 2020.03.31 දිනට සිටි රු. 5,000,000 ක ණයගැතියෙකු 2020.06.03 දින බුන්වත්භාවයට පත් වු අතර එදිනම බේරුම්කරුවෙකුද පත්කරන ලදී. අවසාන බේරුම් කිරීමේදී ණයගැති වටිනාකමෙන් 25% ප්‍රමාණයක් අය කර ගතහැකි වේ යැයි සීමිත Y සමාගමේ ගණකාධිකාරී විශ්වාස කරයි.

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට බලය පවරන ලද්දේ 2020.06.20 දිනදීය.

ඉහත ගණුදෙනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 අනුව 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙසේ නිරූපනය කළ යුතුදැයි ඔබ සිතන්නේද?

### පිළිතුර

**ශ්‍රී ලංකා ගිණුම්කරණ** ප්‍රමිත අංක 10 “වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්” අනුව,වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසු සිදුවීම් ප්‍රධාන වර්ග දෙකකි. ඒවා නම්,

i. වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවැති තත්ත්වයට සාක්ෂි සපයන සිදුවීම්
ii. වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනෙන් පසුව ඇති වූ තත්ත්වයක් නිරූපණය කරන සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට සිටි ප්‍රධාන ණයගැතියෙකු වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනෙන් පසු දිනක දී බුන්වත් වීම වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවැති තත්ත්වයට තවදුරටත් සාක්ෂි සපයන සිදුවීමක් ලෙස හඳුනාගත යුතු අතර එවැනි සිදුවීම් වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට ගැළපිය යුතුයි.

ගැටලුවට අනුව 2020.03.31 දිනට සිටි ණයගැතියෙකු වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනෙන් පසු දිනක එනම් 2020.06.03 දින බුන්වත්භාවයට පත්ව ඇත. මේ නිසා එම බුන්වත්වීම මත අයකරගත නොහැකි ප්‍රමාණය වන රු. 3,750,000, 2020.03.31 දින වන වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට ගැලපිය යුතුයි. එනම් 2019/2020 වසරේ බොල් ණය ලෙස කපාහැර, අයකරගත හැකි වේ යැයි ඇස්තමේන්තු කරන ලද 25% වන රු. 1,250,000 පමණක් 2020.03.31 දිනට සකසන මූල්‍ය තත්ව ප්‍රකාශයේ වත්කමක් ලෙස හඳුනාගත යුතු වේ.

### උදාහරණ : 05

සීමාසහිත ‘‘එක්ස්’’ සමාගමේ ගිණුම් වර්ෂය 2020.03.31 න් අවසන් වේග මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා බලය පවරන ලද්දේ 2020.07.05 දිනදීය.

(අ) 2020'05'10 සීමාසහිත ‘‘එක්ස්’’ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය රු. 800,000 සාමාන්‍ය ලාභාංශයක් ප්‍රකාශ කළේය.

(ආ) 2020'03'31 දින සීමාසහිත ‘‘එක්ස්’’ සමාගමෙ රු. 750,000 ක ණයගැතියෙකු 2020.06.15 දින බුන්වත් බව ප්‍රකාශයට පත්විය.

(ඇ) සීමාසහිත ‘‘එක්ස්’’ සමාගම 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා රු. 785,000 ක නිෂ්පාදන ප්‍රසාද මුදලක් ගෙවීමට ඔවුන් අතර පැවති ගිවිසුමකට අනුව 2020.05.10 දින තීරණය කරන ලදී.

(ඈ) සීමාසහිත ‘‘එක්ස්’’ සමාගමේ නිශ්පාදනයන්ගේ 60% කට දායක වු නිශ්පාදන යන්ත්‍රයක් 2020.04.15 දින ගින්නකින් විනාශ විය. මෙම විනාශයෙන් ඇතිවු අලාභයේ ඇස්තමේන්තු වටිනාකම රු. 3,000,000 කි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ඉහත සඳහන් සිද්ධීන් සම්බන්ධව ඔබ ක්‍රියාකරන ආකාරය සඳහන් කරන්න.

### පිළිතුර

(අ) නොගළපන සිදුවීමකි.
හෙළිදරව් කිරීම ප්‍රමාණවත් වේ.

(ආ) ගළපන සිදුවීමකි.
2020.03.31 දිනට ගැළපිය යුතුයි. එනම් 2019/2020 වසරේ බොල්ණයක් ලෙස කපාහැරිය යුතුයි.

(ඇ) ගළපන සිදුවීමකි.
2019/2020 වසරේ ප්‍රසාද දීමනාවක් ලෙස ගැළපිය යුතුයි.

(ඈ) නොගළපන සිදුවීමකි.
හෙළිදරව් කිරීම ප්‍රමාණවත් වේ.

### උදාහරණ : 06

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 10 වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇතිවන සිදුවීම් ප්‍රධාන වර්ග 2 ක් ලෙස හඳුනා ගනී.

(a) මෙම සිදුවීම් වර්ග 02 මොනවාද?

(b) මෙම සිදුවීම්වලට අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මොනවාද?

### පිළිතුර

a i. වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පැවති තත්ත්වයට සාක්ෂි සපයන සිදුවීම්
ii වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ තත්ත්වයක් නිරූපණය කරන සිදුවීම්

b <u>පොදුවේ කළයුතු හෙළිදරව් කිරීම්</u>

- මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම සඳහා බලය පැවරූ දිනය හා බලය පැවරුවේ කවුරුන් ද යන වග, හා
- ව්‍යාපාරයේ හිමිකරුවන්ට හෝ වෙනත් පාර්ශවයකට මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු ඒවා වෙනස් කිරීමේ බලයක් පවතී නම්, ඒ බව.

වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ තත්ත්වයක් නිරූපණය කරන සිදුවීම්වලට අදාළ හෙළිදරව් කිරීම්

- සිදුවීමේ ස්වභාවය
- අදාළ සිදුවීම් තුළින් ඇතිවන බලපෑම පිළිබඳ ඇස්තමේන්තුවක් හෝ එලෙස ඇස්තමේන්තුවක් කළ නොහැකි නම් ඒ පිළිබඳ ප්‍රකාශයක්.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd